# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2427/35 - 2025 මාර්තු මස 15 වැනි සෙනසුරාදා - 2025.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: 6/3/7/15/9/7.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4/3/10/2020/MV/116.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:-

මොරගහකන්ද/කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ඊ 401ඒ ගල්පොරුගොල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නවනැලිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2025.02.14 දින සම්මත කරන ලද කැ.සි. අංක 310226, කලාප අංක 02 හා පත්‍ර අංක 01 හි පහත සඳහන් ඉඩම් කොටස්.

01. කැබලි අංකය 1
ඉඩමේ නම: මහ කුඹුර, කරකොලගහමුල මුකලාන; වර්තමාන ඉඩම් පරිහරණය: ලඳු කැලය; හිමිකම් කියන්නා: රජය; ඒ. ජී. ලීලාවතී විසින් භුක්ති විඳී; ප්‍රමාණය: හෙක් 1.2140.

02. කැබලි අංකය 2
ඉඩමේ නම: -; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය (පැරණි); හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක් 0.0219.

ඉහත සඳහන් ඉඩම් කැබලි සඳහා හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2025 අප්‍රේල් මස 08 වැනි දින පෙ.ව. 10.00 ට නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2025 අප්‍රේල් මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**එස්. විජයකුමාර්,**
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2025 මාර්තු මස 04 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
නාඋල.

EOG 03 - 0157

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: 6/3/7/18.
*කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/8/2018/PC/76.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් අත්කර ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය:-

මෙහි මහජන කටයුත්තක් යනු හාඩුව කණිෂ්ඨ විද්‍යාලයේ ප්‍රයෝජනය සඳහා ඉඩම් අත්කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ඊ 412සී හාඩුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ 2024.12.26 දින සම්මත කරන ලද කැ.සි. අංක 310190, කලාප අංක 02 හා පත්‍ර අංක 01 හි පහත සඳහන් ඉඩම් කොටස.

1. කැබලි අංකය 1

ඉඩමේ නම: කොලොන්ගොල්ලේහේන; වර්තමාන ඉඩම් පරිහරණය: වත්ත; හිමිකම් කියන අය: ඒ. එම්. කේ. ජී. කරුණාරත්න බංඩා; ප්‍රමාණය: හෙක් 0.743.

ඉහත සඳහන් ඉඩම් කැබලි සඳහා හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2025 අප්‍රේල් මස 08 වැනි දින පෙ.ව. 10.00 ට නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2025 අප්‍රේල් මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් ඉකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**එස්. විජයකුමාර්,**
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2025 මාර්තු මස 06 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
නාඋල.

EOG 03 - 0158

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.